<u>දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව</u>

<u>කළුතර දිස්ත්‍රික්කය</u>

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 16 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 26 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූනි 30 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

#### 1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු සහික දීමනා රු.30,000 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව 2016 වර්ෂයේදී ලැබී තිබූ එකතුව රු.540,839 ක් වූ ප්‍රාග්ධන ආධාර, සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර ගිණුමට බැර කර ණයගැතියන් ගිණුමට හර කළ යුතු වුවත්, එසේ කර නොතිබුණි.

(ඇ) පසුගිය වර්ෂයේ විගණන වාර්තාවේ 2.2(ඉ) ඡේදයේ ණයගැති ගිණුමට වැඩියෙන් බැර කර තිබූ රු.264,409 ක මුදල නිවැරදි කිරීම සඳහා ණයගැති ගිණුම එම ප්‍රමාණයෙන් හර කර සමුච්චිත අරමුදල් ගිණුම බැර කළ යුතු වුවත්, එසේ කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අක්කර බදු මුදල් වැඩියෙන් තක්සේරු කිරීම නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් අංක 35 ට අනුව රු.194,760 ක් සමුච්චිත අරමුදල් ගිණුම හර කර අක්කර බදු මුදල් ගිණුම බැර කළ යුතු වුවත්, ලෙජර් ගිණුම්වලට යොදා තිබුණේ අදාල බැර සටහන පමණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අක්කර බදු ආදායම රු.194,760 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස ණයහිමි ගෙවීම් රු.47,413 ක් ණයහිමි ගිණුමට අඩුවෙන් සටහන් කිරීම නිසා ණයහිමි ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඊ) ඉඩම් වෙන්දේසි කිරීමේදී පොදු පහසුකම් සඳහා 1994 වර්ෂයේ සිට 2015 දක්වා වූ කාලය තුළ සභාව වෙත පවරා දී තිබූ එකතුව අක්කර 31, රූඩ් 1, පර්චස් 5 ක් තරම් වූ ඉඩම් ප්‍රමාණයේ වටිනාකම අගය කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.2 **නොසැසඳුම් ගිණුම්**

(අ) පුස්තකාල පොත් මිලදී ගැනීම්, වැය ලෙජරය අනුව රු.104,122 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන අනුව රු.136,821 ක් වූයෙන් රු.32,699 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ ණයහිමි උපලේඛනයේ දොඩන්ගොඩ කඳනගොඩ මාර්ගයේ සණස සමිති ශාලාව දක්වා මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ණයහිමි ලෙස රු.402,254 ක් ප්‍රතිපාදන වෙන් කර ඇතත් ව්‍යාපෘති ලිපිගොනුව අනුව එය රු.401,064 ක් ලෙස දක්වා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.9,652,945 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.7,035,198 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

2.2.1 **හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.4,957,928 ක් වූ හිඟ ආදායම් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්ති වල විධිවිධාන අනුව අයකර ගෙන නොතිබුණි.

2.2.2 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 25,458,971 ක මුදලක් පහත පරිදි ලැබිය යුතුව තිබුණි.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 17,535,530 |
| මුද්දර ගාස්තු | 7,923,441 |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3:1 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මියගිය, විශ්‍රාම ගිය හා ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 23 දෙනෙකු සඳහා ලබාදී තිබූ එකතුව රු.62,527 ක් වූ ණය ශේෂය 2015 දෙසැම්බර් 31 දින වන විටද අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1981, 2006, 2011 හා 2015 වර්ෂවල ගෙවා තිබූ රු.288,779 ක් වූ අත්තිකාරම් 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 140 ප්‍රකාරව 2016 මාර්තු 30 දින වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 **ඉඩම් අනු බෙදීම්**

1992 සැප්තැම්බර් 30 දිනැති නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන රෙගුලාසි චක්‍රලේඛ අංක 6 හා 2.1 ඡේදය හා 1986 මාර්තු 10 දිනැති එම අධිකාරියේ අංක 393/9 දරන ගැසට් නිවේදනයේ නියෝග අංක 22(i) පරිදි ඉඩම් අනු බෙදීම් සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබූ අවස්ථා 2015 සැප්තැම්බර් 25 දින කරන ලද නියැදි හා භෞතික පරික්ෂාවේදී නිරීක්ෂණය විය.

(අ) ඉඩම් අනු බෙදුම් 07 කින් සභාවට පවරන ලද පිළිවෙලින් පර්චස් 18.2, 67.5, 169.75, 127.5, 146 හා 64.4 ක් වූ ඉඩම් කොටස්වලට අදාල හිමිකම් ඔප්පු සභාවට ලබාගැනීමට විගණිත දිනය වූ 2015 සැප්තැම්බර් 25 දින වන විටත් සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) පොදු පහසුකම් සඳහා සභාවට පවරා තිබූ කපුගහවත්ත කොට්ටයාහේන හා පෙට්ටිගලවත්ත හි පර්චස් 126.5 ක් හා පර්චස් 67.5 ක් පිළිබඳව 2015 සැප්තැම්බර් 25 දින කරන ලද භෞතිකව පරීක්ෂාවේදී එම ඉඩම්වල සීමා මායිම් පැහැදිලිව හඳුනාගත හැකි ලෙස හඳුනාගැනීමේ සළකුණු යොදා සීමා මායිම් වෙන් කොට නොතිබූ අතර එය සභාවට අයත් පොදු ඉඩම් කොටස බවට හඳුනාගත හැකි ලෙස සභාවේ නාමපුරුවක්ද එහි සවි කර නොතිබුණි.

(ඇ) පිඹුරු අංක 3612005, 3622005 මගින් අනුබෙදීම අනුමත කර තිබූ කඳනගොඩ කැලේ ඉඩමේ ප්‍රමාණය පර්චස් 602.3 ක් වීම නිසා ඉන් සියයට 10 ක ප්‍රමාණය ලෙස පර්චස් 60.23 ක ඉඩම් කොටසක් සභාවට පැවරිය යුතු වුවද පවරා තිබුණේ පර්චස් 44 ක් වූ ඉඩම් කොටසකි. සභාවට ගෙවා තිබූ සියයට 1 ක බදු මුදල සමග සැසඳීමේදී සභාවට අඩුවෙන් පවරා තිබූ ඉඩම් ප්‍රමාණය පර්චස් 16.23 ක් වූ අතර එහි වටිනාකම රු.292,140 ක් විය.

4. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය